ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - III | කාලය පැය දෙකයි. |
|---|---|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) "ඕවා ගිහින් කියනවා මට නෙවෙයි උසාවියට "
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙය උපුටාගත් මුල් කෘතියේ නම කුමක් ද?

(ii) "පුත මා විසින් කුමක් කළ මනා වේ ද?"
(අ) මෙහි " පුත" යනුවෙන් සඳහන් පුද්ගලයාගේ නම ලියන්න.
(ආ) මෙය උපුටාගත් පාඩමේ නම කුමක් ද?

(iii) පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
........................................... ..............
........................................... ..............

(අ) මෙහි ඉතිරි පද්‍ය පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය ඇතුලත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) "උඹ දැන් ඉක්මන් කරලා ගමට යන එකයි වඩා හොඳ."
(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කා හට ද?
(ආ) මෙම පාඨය ඇතුලත් කෘතියේ නම කුමක් ද?

(v) "එසේ වී නම් මම උන් හා එක් වෙමි."
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම පාඨය ඇතුලත් ග්‍රන්ථය රචනා වූයේ කිනම් සාහිත්‍ය යුගයේ ද?

(vi) ................................................... ....................
................................................... ....................
රන්වන් කරල් ගෙන එන ගිරවුන් අතින
යන් මන් තොසින් මහ තොරතුරු නියම දැන

(අ) මෙහි මුල් පද්‍ය පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය ඇතුලත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(vii) "ඔහු කෙරෙහි ඇතිවූ ප්‍රේමය නිසා මම රජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි දරුවනි."
(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය උපුටාගත් කෘතියේ නම කුමක් ද?

www.edudept.up.gov.lk

(viii) "මහරජ නො බව මාගෙ ගෙහි කුමරෙක් උපන."

(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම පාඨය ඇතුලත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ix) "ඇත්ත නේන්නං ! මට එහෙම එකක් ගැන කල්පනාවක් වුනේ ම නැනේ. "

(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙය උපුටාගත් පාඩමේ නම ලියන්න.

(x) නිදහස මහ මුහුදක් වේ
ආගම මිණි පහනක් වේ
........................................................
........................................................

(අ) මෙහි ඉතිරි පද්‍යා පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍යා පන්තිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(2 x 10 = 20)

(2) පහත සඳහන් ගද්‍යා පද්‍යා පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) කුළින් කුළම සිහිල`ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙවතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු`පුල පඬෙරුය

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.
(ආ) දොළක් දොළක් පාසා දැකිය හැක්කේ මොනවා ද?

(ii) ඒ සස්තෙපුල් හා සමඟ ඩබරායෙන් ගුළු දියක් සෙයින් දරු නික්මිණ.
(අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.
(ආ) මෙහි සඳහන් උපමාව හා උපමේය වෙන වෙන ම ලියා දක්වන්න.

(iii) ගුත්තිල මහ සිපී
සක්දෙව් බසින් සැතපී
මින් දිනමැ'යි දැපී
බමර තත පළමුවෙන් සිඳපී

(අ) මෙම පද්‍යයේ සඳහන් පරිදි ගුත්තිල ඇදුරිඳු කළ ක්‍රියාව කෙටියෙන් පැහැදිලි කරන්න.
(ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(iv) කස්තුරි තිලක සැදි නළලත සුමටාන
පුල් මහනෙල් මල් දම් හිස දවටාන
සලෙළුන් යනෙන නිති කැර කෙළි කවටාන
රිවි මුදුනත වන මැද වදු සුමුටාන

(අ) වනය මැදට ඇතුලු විය යුත්තේ කිනම් අවස්ථාවක ද?
(ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(v) උග්ගසේන සිටු පුත්‍රයාණෝ ද කර'ග රහත් වන්නා සේ නොවන බව මුන් හුණ දඬු අග දී පිළිසිඹියාපත් රහත්ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළගට ගොසින් පසඟ පිහිටුවා. වැඳ ගෙන මහණ කරන්නට ආරාධනා කළහ.

(අ) උග්ගසේන බුදුන්ට කළ ආරාධනාව කුමක් ද?
(ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

www.edudept.up.gov.lk

(4 x 5 = 20)

03) ගුත්තිල පඬිතුමාගේ සුමිහිරි වීණා වාදනයේ මිහිරියාවෙන්

i) සත්ත්ව සමූහයා ද,
ii) මනුෂ්‍යයෝ ද,
වසඟ වූ ආකාරය අපූරුවට නිරූපණය කිරීමට වැත්තෑවේ හිමියන් සමත් වී ඇත. ගුත්තිල වෙණ නද පාඩම ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් සපයමින් විස්තර කරන්න.

නැතහොත්

අපටත් වැසිකිළියක් කෙටි කතාවේ සාර්ථකත්වයට එහි

i) අවස්ථා හා සිද්ධි නිරූපණය
ii) උචිත භාෂාවක් යොදාගෙන තිබීම,

යන සාධක බෙහෙවින් ඉවහල් වී ඇති ආකාරය එක් කරුණකට නිදසුන් දෙක බැගින් සපයමින් විස්තර කරන්න.

(ලකුණු 15)

04) අඟුල්මල් දමනයෙහි එන අංගුලිමාලගේ චරිතය
i) උසස් මානුෂීය ගති ලක්ෂණ ඇත්තෙකු ලෙස ද,
ii) තවත් විටෙක බිහිසුණු මිනීමරුවෙකු ලෙස ද,
නිරූපණය කර ඇති ආකාරය එක් කරුණකට නිදසුන් දෙක බැගින් සපයමින් ගෙනහැර දක්වන්න.

නැතහොත්

"මුනි සිරිපා සිඹිමින්නේ " යන පද්‍ය පන්තිය තුළින් එස්. මහින්ද හිමියන් අපේක්ෂා කර ඇත්තේ,
i) ආගම දහමට නැඹුරු වූ,
ii) උපන් බිමට ගරු කරන ,
උදාර දරු පරපුරක් බිහි කිරීමයි. එක් කරුණකට නිදසුන් දෙක බැගින් සපයමින් මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 15)

05) සිංහබාහු නාට්‍යයේ එන සිංහබාහු තරුණ වියට අදාළ හැඟීම් මැනවින් ඉස්මතු කරන නිර්භීත තරුණයකු ලෙස නිරූපණය කර ඇත. "ලෙන අතහැර යෑම" පාඩම ඇසුරෙන් නිදසුන් තුනක් සපයමින් පෙන්වා දෙන්න.

06) උම්මග්ග ජාතක කතාවේ එන මහෞෂධ පඬිතුමාගේ චරිතය උපායශීලී ව අභියෝගවලට මුහුණ දෙන චරිතයකි. අදාළ නිදසුන් තුනක් සපයමින් මෙම කියමන පහදන්න.

07) "වස්සානය"පද්‍ය පන්තිය වැසි සමයේ පරිසරයේ ඇති කරන චමත්කාරය අපූරුවට වර්ණනා කරන පැදි පෙළකි. අදාළ නිදසුන් තුනක් සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

www.edudept.up.gov.lk